# 2 අපේ කීර්තිමත් රජවරු

**හැඳින්වීම**

අනුරාධපුර රාජ්‍ය සමය මුල් භාගයේ අපේ රටේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයන් වූ පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වලගම්බා, වසභ, මහසෙන්, ධාතුසේන වැනි රජවරුන් ගැන හයවන ශ්‍රේණියේ දී ඔබට ඉගෙනීමට ලැබුණි. අනුරාධපුර රාජ්‍ය සමය අග භාගයේ හා පොළොන්නරු යුගයේ දී රටේ යහපත වෙනුවෙන් විශාල කැපවීමක් කළ කීර්තිමත් රජවරුන් කිහිප දෙනෙකු පිළිබඳ මෙම පාඩමෙන් විස්තර කෙරේ.

## මානවම්ම රාජ්‍ය සමයට පෙර පැවති දේශපාලන තත්ත්වය

වසභ රජතුමා ලම්බකර්ණ රජ පෙළපතට අයත් පාලකයෙකි. ධාතුසේන රජු මෞර්ය වංශිකයෙකි. අනුරාධපුර යුගයේ වැඩි කාලයක් මෙරට පාලන බලය දරන ලද්දේ ඉහත කී ලම්බකර්ණ හා මෞර්ය රජ පෙළපත්වලට අයත් පාලකයන් විසිනි. එහෙත් ඇතැම් අවස්ථාවල දේශපාලන බලය ලබා ගැනීම පිණිස මෙම රජ පෙළපත් දෙක අතර බල අරගල පැවතුණි. මානවම්ම රජු බලයට පත්වීමට වසර 50 කට පමණ පෙර කාලයේ දී ද ලම්බකර්ණ හා මෞර්ය රජ පෙළපත් අතර මෙබඳු දේශපාලන ගැටුමක් පැවතුණි. එම කාලපරිච්ඡේදයේ දී මෙරට දේශපාලන ක්ෂේත්‍රය තුළ දක්නට ලැබුණු කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- අභ්‍යන්තර ගැටුම් නිසා රටේ ස්ථාවර පාලනයක් බිහි නො වීම
- සටන් සඳහා රටේ සම්පත් විශාල ලෙස විනාශ වීම
- රාජ්‍ය බලය ලබා ගැනීමේ සටන් සඳහා දෙපාර්ශ්වයේ ම නායකයන් දකුණු ඉන්දියානු හමුද මෙරටට ගෙන්වීම
- දේශපාලන ගැටුම් හේතු කොට ගෙන රටේ ආර්ථික පරිහානියක් ඇති වීම

## මානවම්ම රජතුමා

මානවම්ම යනු දෙවන කස්සප රජුගේ පුතෙකි. දෙවන කස්සප රජු ක්‍රි. ව. 650 පමණ බලයට පැමිණ වසර නවයක් රට පාලනය කළේ ය. කිසියම් රෝගයකින් දෙවන කස්සප රජු මිය යන විට මානවම්ම කුමරු බාල වයසේ පසු වූ බව පෙනේ. එසේ ම දෙවන කස්සප රජුගේ අභාවයෙන් පසුව ද පාලන බලය ලබා ගැනීම සඳහා ගැටුම් පැවතුණි. මෙම ගැටුම්වලට සම්බන්ධ නොවූ මානවම්ම කුමරු ආරක්ෂාව පතා අප්‍රසිද්ධව ජීවත් විය. එවකට පාලකයා වූ දෙවන දලෝපතිස්ස රජු මානවම්ම කුමරුන් ගැන සෙවිල්ලෙන් පසු වූ හෙයින් එම කුමරු පසුව ඉන්දියාවට පලා ගියේ ය.

ඉන්දියාවේ පල්ලව රාජධානියට පලා ගිය මානවම්ම කුමරුන් පළමුවන නරසිංහවර්මන් නම් පල්ලව රජුට හිතවත්ව සේවය කර ඇත. මෙසේ මානවම්ම කුමරු පල්ලව රජුගේ සටන්වලට සහාය ලබාදීම නිසා ඒ රජු කුමරු ගැන පැහැදුණි. ඒ නිසා පළමුවන නරසිංහවර්මන් රජු කෘතගුණ සැලකීමක් වශයෙන් මානවම්ම කුමරුට හමුදවක් ලබා දී ලංකාවට පැමිණ බලය ලබා ගැනීමට උපකාර කළේ ය. මානවම්ම කුමරුන් එම හමුදව සමග මෙරටට පැමිණ දෙවන දලෝපතිස්ස රජුට එරෙහිව සටන් ආරම්භ කර ඇත. එහෙත් සටන කරගෙන යද්දී ඉන්දියාවේ සිටි පල්ලව රජුට අසනීප වීම නිසා සහායට පැමිණි හමුදවෝ ඉන්දියාවට ගියහ. මේ නිසා සටන අතර මග නතර කොට ආරක්ෂාව පතා මානවම්ම කුමරුට ද යළි ඉන්දියාවට යාමට සිදු විය. මෙසේ නැවත වරක් ඉන්දියාවට ගිය මානවම්ම කුමරු තම අරමුණ ඉටු කර ගැනීම සඳහා සහායක හමුදවක් ලබා ගැනීමට තවත් වසර 20ක් පමණ පල්ලව රජුට සේවය කළේ ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

එවකට පල්ලව රජු වූ දෙවන නරසිංහවර්මන් නැවත වරක් හමුදවක් ලබා දුන් හෙයින් එම හමුදවන් සමග ලංකාවට පැමිණි මානවම්ම කුමරු මෙරට පාලකයා වශයෙන් සිටි හත්ථදාඨ රජු පරාජයට පත් කොට ක්‍රි. ව. 684 දී රජකම ලබා ගත්තේ ය. මානවම්ම කුමරුන් රජකමට පත්වීම මෙරට ඉතිහාසයේ වැදගත් සිදුවීමකි. අධිෂ්ඨානශීලීව හා ඉවසිලිවන්තව කටයුතු කිරීමෙන් තම අරමුණ ජයගත හැකි බව එතුමාගේ චරිතයෙන් පෙනේ.

මානවම්ම කුමරුන් බලයට පත් වීමට පෙර වසර 50ක පමණ කාලයක් රටේ අභ්‍යන්තර ගැටුම් උත්සන්නව පැවතීම නිසා දේශපාලන තත්ත්වය හා ආර්ථිකය පිරිහී තිබුණි. වසර 20කට වැඩි කාලයක් පල්ලව රාජ්‍යයේ ගත කිරීමට සිදුවීම නිසා මානවම්ම කුමරුට රජකම ලබා ගැනීමට හැකි වූයේ ජීවිතයේ මැදි වයසේ දී පමණ ය. එහෙත් තවත් වසර 35ක් පමණ දිගු කාලයක් මෙරට පාලන කටයුතු මෙහෙයවීමට මානවම්ම රජුට හැකියාව ලැබුණි. මේ නිසා නැවත වරක් රටේ දේශපාලන ස්ථාවරත්වයක් ඇති විය. මෙතුමාගේ කාලයේ දී රටේ සාම්ප්‍රදායික පරිපාලන තන්ත්‍රය නැවත පිහිටු වූ බව පෙනේ. එවක රජකම උරුමයට හිමිවීමේ සාම්ප්‍රදායික පිළිවෙත ද නැවත ආරම්භ විය. මානවම්ම රජුගෙන් පසු එතුමාගේ දරුවෝ පිළිවෙළින් රජකමට පත් වූහ. මානවම්ම රජුගේ පෙළපත අනුරාධපුර යුගය අවසානය දක්වා තවත් වසර 300ක් පමණ පැවතුණි.

## පළමුවන සේන රජතුමා

පළමුවන සේන යනු මානවම්ම පරපුරට අයත් දෙවන දප්පුල රජුගේ පුතෙකි. දෙවන දප්පුල රජු වසර 16ක් පමණ රජකම් කොට මිය යාමෙන් පසුව ඔහුගේ පුතෙකු වූ නවවන අග්ගබෝධි බලයට පත් විය. ඔහුගේ පාලන කාලය වසර තුනකි. අනතුරුව අග්ගබෝධිගේ සහෝදරයා වූ පළමුවන සේන රජු ක්‍රි. ව. 833 දී රජකමට පත් විය. පළමුවන සේන රජුගේ පාලන කාලය වසර විස්සකි. ඔහුගේ පාලන කාලයේ මුල් භාගයේ දී ලංකාවට පාණ්ඩ්‍ය ආක්‍රමණයක් එල්ල විය. මේ කාලයේ දී දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය රාජ්‍ය බලවත් වෙමින් පැවතිණි. **ශ්‍රී මාර ශ්‍රී වල්ලභ** නම් පාණ්ඩ්‍ය රජු විශාල හමුදවක් සමග මෙරට ආක්‍රමණය කළ විට පළමුවන සේන රජුගේ හමුදව පරාජයට පත් විය. සේන රජු වෙනුවෙන් සටන් බිමට ගිය රජුගේ සහෝදරයෙකු වූ යුව රජු මහින්ද කුමරු හා ආදිපාද කස්සප කුමරු ද සටනේ දී මියගොස් ඇත. තම හමුදව පරාජයට පත් වීමත් සමග පළමුවන සේන රජු ආරක්ෂාව පතා මලය ප්‍රදේශයට පලා ගියේ ය.

අනුරාධපුර නගරයට ඇතුළු වූ පාණ්ඩ්‍ය හමුදවෝ එම නගරය මුළුමනින් ම කොල්ල කෑහ. පසුව පාණ්ඩ්‍ය රජු හා සේන රජු අතර සාම ගිවිසුමක් ඇති වූ හෙයින් පාණ්ඩ්‍යයෝ සේන රජුට නැවත රාජ්‍ය පවරා ආපසු ඉන්දියාවට ගියහ. මේ ආක්‍රමණයේ අරමුණ ලංකාව යටත් කර ගැනීමට වඩා වටිනා වස්තුව කොල්ලකෑම බව පෙනේ. නැවත අගනුවරට පැමිණි පළමුවන සේන රජු ආක්‍රමණික හමුදව අතින් විනාශ වූ ප්‍රදේශ යළි යථා තත්ත්වයට පත් කිරීමට වෙහෙසුණි. ඊට අමතරව රිටිගල ආරාමය, ජේතවනාරාමය, අභයගිරිය වැනි විහාරාරාම ආශ්‍රිතව නව ඉදි කිරීම් රැසක් ද කරවා තිබේ.



රූපය 2.1 රිටිගල පෙත්මග



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රජුගේ සහෝදරයන් දෙදෙනෙකු පාණ්ඩ්‍යයන් හා කළ සටනෙන් මිය ගිය හෙයින් තවත් සහෝදරයෙකු වූ උදය කුමරු යුව රජකමට පත් කෙරිණි. එහෙත් උදය කුමරු ටික කලකින් කිසියම් රෝගයකින් මිය ගියේ ය. මේ නිසා ඉහත සටනේ දී මිය ගිය කස්සප කුමරුගේ වැඩිමහල් පුතු වූ සේන කුමරුන් යුව රජ තනතුරට පත් කොට රුහුණේ පාලන කටයුතු භාර කෙරිණි.

## දෙවන සේන රජතුමා

දෙවන සේන යනු පළමුවන සේන රජුගේ සහෝදරයෙකු වූ පාණ්ඩ්‍ය ආක්‍රමණයේ දී මිය ගිය ඉහත කී කස්සප ආදිපාදයන්ගේ පුතෙකි. පළමුවන සේන රජුගේ අභාවයෙන් පසුව එවකට යුව රජ තනතුර දරමින් සිටි දෙවන සේන රජකමට පත් විය. ඔහුගේ රාජ්‍ය කාලය වසර තිස්පහක් (ක්‍රි. ව. 853 - 887) පමණ වන අතර එම කාලය තුළ රටේ සාමය පැවතුණි. දේශපාලන වශයෙන් පැවති සාමකාමී තත්ත්වය නිසා රටේ පැරණි ශ්‍රී විභූතිය නැවත ඇති කරමින් ආර්ථික හා ශාසනික ක්ෂේත්‍රයේ විශාල වැඩ කොටසක් කිරීමට දෙවන සේන රජුට හැකියාව ලැබුණි.

පළමුවන සේන රජුගේ කාලයේ දී සතුරු ආක්‍රමණ නිසා විනාශ වූ සියල්ල යළි ගොඩනැගීමේ කටයුතු දෙවන සේන රජු විසින් සම්පූර්ණ කරන ලදි. ශාසනික චිරස්ථිතිය සඳහා සිදු කළ සේවයට අමතරව මිහින්තලේ රෝහලක් කර වීම, මහවැලි ගඟේ මණිමේකලා (මිනිපේ) නම් ප්‍රදේශයේ අමුණක් අලුත්වැඩියා කරවීම, මින්නේරිය වැවේ සොරොව්වක් තැනවීම ආදිය දෙවන සේන රජුගේ මහජන ශුභ සිද්ධියට අදළ කටයුතුවලට උදාහරණ වේ.

දෙවන සේන රජු පාණ්ඩ්‍ය රාජධානිය ආක්‍රමණය කිරීම ඔහුගේ රාජ්‍ය කාලයේ කැපී පෙනෙන සිදුවීමකි. පළමුවන සේන රජුගේ කාලයේ පාණ්ඩ්‍යයන් මෙරට ආක්‍රමණය කොට වස්තුව පැහැරගෙන යාම ගැන මේ රජුගේ සිතේ වේදනාවක් තිබෙන්නට ඇත. එබැවින් සිදු වූ අපකීර්තිය මකා දමා පාණ්ඩ්‍යයන් පැහැරගෙන ගිය වස්තුව යළි මෙරටට රැගෙන ඒමට එතුමා අවස්ථාවක් සොයමින් සිටියා විය හැකි ය. පාණ්ඩ්‍ය කුමරෙකු වූ **දෙවන වරගුණවර්මන්** කුමාරයා පාණ්ඩ්‍ය රාජ්‍යයේ සටනක් සඳහා ආධාර ඉල්ලාගෙන මෙරටට පැමිණීම නිසා ඔහුගේ සහය ද ලබා ගෙන පාණ්ඩ්‍ය රාජධානිය



රූපය 2.2 මිහින්තලේ පැරණි රෝහල් භූමියේ නටබුන්



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

ආක්‍රමණය කිරීමට දෙවන සේන රජුට අවස්ථාව ලැබුණි.

දෙවන සේන රජු තම දක්ෂ සෙන්පතියෙකු වූ **කුට්ඨක** සෙනෙවියාගේ ප්‍රධානත්වයෙන් යුත් බලවත් හමුදාවක් පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණයට යැවීය. පාණ්ඩ්‍ය හමුදාව හා ලාංකික හමුදාව අතර ඇති වූ සටනෙන් පාණ්ඩ්‍ය හමුදාවෝ පරාජයට පත් වූහ. පාණ්ඩ්‍ය අගනුවර වූ **මදුරාපුරය** වටලා ලාංකික හමුදාව එල්ල කළ ප්‍රහාරයේ දී **ශ්‍රී මාර ශ්‍රී වල්ලභ** නම් පාණ්ඩ්‍ය රජු ද මරණයට පත් විය. අනතුරුව දෙවන සේන රජුගේ නියෝජිතයෙකු වශයෙන් **වරගුණවර්මන්** කුමාරයා ලාංකික හමුදාව විසින් පාණ්ඩ්‍ය සිංහාසනයට පත් කරන ලදි. මෙහි දී පාණ්ඩ්‍යයන් ලංකාවෙන් පැහැරගෙන ගොස් තිබූ වස්තුව පමණක් නොව පාණ්ඩ්‍යයන්ගේ වස්තු සම්භාරයක් ද රැගෙන ලාංකික හමුදාවෝ ජයග්‍රාහී ලීලාවෙන් යළි මෙරටට පැමිණියහ. දෙවන සේන රජු ලැබූ මෙම ජයග්‍රහණය ගැන මෙරට සෙල්ලිපි කිහිපයක සඳහන් වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි **ඉරිපින්නියාව** නම් ස්ථානයෙන් ලැබුණු සෙල්ලිපියක කුට්ඨා සෙනවිරදුණන් යනුවෙන් සඳහන් වනුයේ පාණ්ඩ්‍ය ආක්‍රමණය මෙහෙයවූ කුට්ඨක සෙනෙවියා ගැන බව පැහැදිලි ය.

## රාජ්‍ය පාලන සංවිධානය

### මධ්‍ය පාලනය

රජු හා රජුට සහාය වූ නිලධාරීන් පිරිසක් මගින් රට පුරා බල පැවැත්වෙන ලෙස සංවිධානය වී තිබූ පාලන තන්ත්‍රය මධ්‍ය පාලනය ලෙස සැලකිය හැකි ය. රජතුමා මධ්‍ය පාලනයේ ප්‍රධානියා විය. එක් රජ කෙනෙකුට පසුව ඊළඟ රජු බලයට පත් වූයේ රජකම උරුම වීමේ සාම්ප්‍රදායික ක්‍රමයකට අනුව ය. අනුරාධපුර යුගයේ දී බහුල වශයෙන් පැවති රජකම උරුම වීමේ ක්‍රම දෙකක් තිබුණි.

✦ පියාගෙන් පසුව පුතාට රජකම උරුම වීම

උදාහරණය : පණ්ඩුකාභය රජුගෙන් පසුව එතුමාගේ පුත් මුටසිවට රජකම උරුම වීම

✦ වැඩිමහල් සහෝදරයාගෙන් පසුව බාල සහෝදරයාට රජකම උරුම වීම

උදාහරණය: දුටුගැමුණු රජුගෙන් පසුව එතුමාගේ සහෝදර සද්ධාතිස්ස කුමරුට රජකම උරුම වීම

අනාගත රජකම උරුම කුමරාට ළමා අවදියේ දී හොඳ අධ්‍යාපනයක් ලබා දීමට රජවරු සැලකිලිමත් වූහ. භාෂාව හැදෑරීම හා ලේඛන කටයුතු පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දෙන ලද්දේ බොහෝ විට භික්ෂූන් වහන්සේලා විසිනි. පාලකයෙකුට එකල අවශ්‍ය වූ කඩු ශිල්පය, දුනු ශිල්පය වැනි ශිල්පීය අධ්‍යාපනය ඒ ඒ විෂය ප්‍රවීණයන් යටතේ සිදු විය.

නව රජ කෙනෙකු බලයට පත් වූ පසුව අභිෂේක උත්සවයක් පැවැත්වීමේ සිරිතක් තිබුණි. රජෙකුගේ අභිෂේකය යනු ඔහුගේ වගකීම නිත්‍යානුකූලව භාර ගැනීම වැනි අවස්ථාවකි.

රටේ මධ්‍ය පාලනයේ ඉහළ ම තැනැත්තා රජු වූ බැවින් ඔහුට අයත් කාර්යයන් රැසක් තිබුණි. පහත සඳහන් කටයුතු එබඳු කාර්යයන්ට උදාහරණ වේ.

- ✶ රටේ නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- ✶ බාහිර හා අභ්‍යන්තර සතුරු උවදුරු වලින් රට ආරක්ෂා කර ගැනීම.
- ✶ මධ්‍ය පාලනයට හා ප්‍රදේශීය පාලනයට අවශ්‍ය නිලධාරීන් පත් කිරීම.
- ✶ රටේ ආර්ථික කටයුතු හැසිරවීම හා අයබදු පැන වීම.
- ✶ අධිකරණ කටයුතු මෙහෙය වීම.

රාජ්‍ය පාලන කටයුතුවල දී රජුට සහාය වූ නිලධාරිහු පිරිසක් සිටියහ. **යුවරජු** (අනාගත රජකම උරුම තැනැත්තා), සේනාපති, භාණ්ඩාගාරික, මහා ලේඛක (ලේඛන කටයුතු භාර ප්‍රධානියා) එම නිලධාරි පිරිස අතර කැපී පෙනුණි. රජුට සහාය වූ මෙබඳු නිලධාරින්ගෙන් සමන්විත රාජ සභාවක් පැවතුණි. රටේ වැදගත් ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා රජුගේ ප්‍රධානත්වයෙන් රාජ සභාව රැස් වූ බව නිසැක ය. අනුරාධපුර යුගයේ ඇතැම් ශිලා ලිපිවල '**අදෙකවරු**' නම් නිලධාරින් පිරිසක් ගැන සඳහන් වේ. මෙය සංස්කෘත භාෂාවේ අධ්‍යක්ෂ යන්නට සමාන පදයකි.

'**අශ අදෙක**' අශ්ව අධ්‍යක්ෂ (අශ්වයන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා)

'**අති අදික**' හස්ති අධ්‍යක්ෂ (ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා)

ඉහත උදාහරණවලින් දැක්වෙන අදෙක/අදික යන නිලධාරින් ඒ ඒ දෙපාර්තමේන්තු හෙවත් කාර්යාංශ භාර ප්‍රධානීන් ලෙස සැලකිය හැකි ය.

මානවම්ම රජු බලයට පත් වීමට පෙර රටේ අභ්‍යන්තර ගැටුම් පැවති සමයේ දී සාම්ප්‍රදායික රාජ්‍ය උරුමය නොසලකා ඇතැම් අය බලය ලබා ගෙන ඇත. එහෙත් මානවම්ම පෙළපත බලයේ සිටි කාලයේ දී පැරණි රාජ්‍ය උරුම ක්‍රමය නැවත යථා පරිදි ක්‍රියාත්මක විය. මේ යුගයේ ඇතැම් රජවරු ශිලා ලිපි පිහිටුවීමේ දී තමා **ඈපා** (ආදිපාද) **මාපා** (මහාදිපාද) පදවි දරමින් පිළිවෙලින් රජ පැමිණි බව කියා තිබේ. ඈපා, මාපා වැනි ඉහළ තනතුරු වලට පත් වූයේ රජ පවුලේ කුමාරවරුන් ය. මේ නිසා එම තනතුරු දැරීමෙන් අනාගත රාජ්‍ය පාලනයට අවශ්‍ය පුහුණුවක් ලැබුණු බව පෙනේ.

## ප්‍රදේශීය පාලනය

අනුරාධපුර යුගයේ දී රාජ්‍ය මැනවින් සංවිධානය වූ පරිපාලන ඒකකවලට බෙදා තිබුණි. රජුගේ ප්‍රධානත්වයෙන් පැවති මධ්‍යගත පාලනයට අමතරව ඒ ඒ ප්‍රදේශ භාර නිලධාරින් මගින් ප්‍රදේශීය පාලනය ක්‍රියාත්මක විය. රටේ අගනුවර වූ අනුරාධපුර නගරය අවට ප්‍රදේශ උතුරු, දකුණු, නැගෙනහිර හා බස්නාහිර වශයෙන් දිසා අනුව කොටස්වලට බෙදා තිබුණි. මීට අමතරව රට හෙවත් **රට්ඨ** යනුවෙන් හැඳින් වූ පරිපාලන ප්‍රදේශ පැවතුණි. මේවායේ පරිපාලන කටයුතු මෙහෙයවූ නිලධාරීන් **රට්ඨලදු** හෙවත් **රටලද්දන්** වශයෙන් හැඳින්විණි.

අගනුවරට බැහැරින් පිහිටි ප්‍රදේශ, මලය රට, මායා රට හා රුහුණ වශයෙන් වෙන වෙනම පරිපාලන නිලධාරින් යටතේ පැවතුණි. රාජ්‍යයේ කුඩා ම පරිපාලන ඒකකය **ගම** විය. අනුරාධපුර යුගයේ මුල් කාලයේ ගම් පාලනය කළ පිරිස **ගමික** යනුවෙන් හඳුන්වා ඇත. අනුරාධපුර යුගය අවසාන භාගයේ දී ගම් පාලනය කළ අය **ගම්ලද්දන්** ලෙස හඳුන්වා තිබේ.

## රාජ්‍යය ප්‍රතිපත්ති හා සමාජ ශුභසාධනය

රාජ්‍යය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අනුරාධපුර යුගයේ සිටි රජවරු විශේෂ සැලකිල්ලක් දැක්වූහ.

- රටේ ආරක්ෂාව සැලසීම
- නීතිය හා සාමය පවත්වාගෙන යාම
- ආර්ථික ශුභසිද්ධිය ඇති කිරීම
- ශාසනික අභිවෘද්ධියට කටයුතු කිරීම

මානවම්ම පෙළපත බලයේ සිටි කාලයේ දී ද මෙම මූලික ප්‍රතිපත්ති එලෙස ම ක්‍රියාත්මක වූ බව පෙනේ.

## රටේ ආරක්ෂාව සැලසීම

රටේ ආරක්ෂාව සැලසීමේ දී රජුගේ සේනාපති, හමුදාව හා ප්‍රදේශීය අධිපතියෝ රජුට සහාය වූහ. අනුරාධපුර යුගය මුල් භාගයේ දී රජුගේ හමුදාව ඇත්, අස්, රිය,



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පාබල යන චතුරංගනී සේනාවන්ගෙන් සමන්විත විය. මානවම්ම පෙළපත බලයේ සිටි කාලයේ දී ද රජුට ශක්තිමත් හමුදවක් සිටි අතර දකුණු ඉන්දියානු හේවායන්ගෙන් සමන්විත වැටුප් ලැබූ හමුද පිරිසක් ද ඒ අතර සිටි බව පෙනේ.

ලංකාවේ රජවරු නගර නිර්මාණය කිරීමේ දී ඒවායේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වූහ. අනුරාධපුර නගරය ආරම්භයේ සිට ම නගර ප්‍රකාර, වාසල් දොරටු ආදි පූර්ව ආරක්ෂක සංවිධාන සහිතව ගොඩනගා තිබුණි.

දේශීය හෝ විදේශීය සතුරු උවදුරුවලට මුහුණ දීමේ දී බලකොටු ඉදි කිරීම හා ආරක්ෂක ස්ථානවල මුරකාවල් යෙදීම ද ආරක්ෂක උපාය මාර්ගයක් වශයෙන් පැවතුණි.

## නීතිය හා සාමය පවත්වාගෙන යාම

අනුරාධපුර යුගයේ දී රට තුළ හොඳ නීති පද්ධතියක් ක්‍රියාත්මකව පැවති බව පෙනේ. මානවම්ම පෙළපත බලයේ සිටි කාලයට අදළව මෙම නීති රීති කියා පාන ශිලා ලිපි රැසක් හමු වී තිබේ. එම නීති පද්ධතිය තුළ,

- ඉඩම් භුක්තිය පිළිබඳ නීති
- වෙළෙඳාම පිළිබඳ නීති
- කෘෂිකර්මය හා බදු සම්බන්ධ නීති
- අපරාධ නීති

වශයෙන් නීති වර්ග රැසක් පැවතුණි.

ක්‍රි. ව. 10 සියවසට අයත් **වේවැල්කැටිය** ශිලා ලිපිය එකල පැවති නීති රීති ගැන සඳහන් ඉතා වැදගත් ලේඛනයකි. දසගම් පාලනයට හා අපරාධ නඩු විසඳීමට අදළ නීති රැසක් එම ශිලා ලිපියෙන් විස්තර කෙරේ. ස්ථාන කිහිපයකින් මෙම ශිලා ලිපියේ පිටපත් කිහිපයක් හමු වී තිබීමෙන් රජයේ නීති රීති මහජනතාවට දැන ගැනීමට සලස්වා ඇති බව පැහැදිලි වේ.

අනුරාධපුර යුගය අවසාන භාගයේ දී රජවරු හෝ උසස් නිලධාරින් යම් යම් පුද්ගලයන්ට හා ආයතනවලට විශේෂ බලතල හා වරප්‍රසාද පවරා දීමේ දී **'අන්තානි කණු'** වල ලියූ ලේඛන මගින් මහජනතාව දැනුම්වත් කිරීමට කටයුතු කර ඇත. මේ අනුව අන්තානි කණු යනු රාජකීය දීමනා පිළිබඳ සඳහන් ශිලා ලිපි විශේෂයකි.

## ආර්ථික ශුභසිද්ධිය

රටේ ආර්ථික ශුභසිද්ධියට අදළව දැහැමි පාලනයක් පවත්වාගෙන යාම අතීතයේ මෙරට රාජ්‍ය ප්‍රතිපත්තිය විය. අනුරාධපුර යුගයේ රජවරු වැව් හා වාරි මාර්ග තැනවීම, ඒවා නඩත්තු කිරීම ගැන මහත් උනන්දුවෙන් කටයුතු කළේ එය මහජන ශුභ සිද්ධියට අත්‍යවශ්‍ය බැවිනි.

පාලන කටයුතුවල දී මෙන් ම අය බදු පැනවීමේ දී ද **'පෙර සිරිත'** අනුව ක්‍රියා කිරීමට රජුට සිදු විය. **'පෙර සිරිත'** යනු කලින් රජවරුන් අනුගමනය කළ පිළිගත් ප්‍රතිපත්තිය වේ. **'පෙර සිරිත'** අනුගමනය කිරීම කොතරම් වැදගත් ද යත් අනුරාධපුර යුගය අග භාගයේ ඇතැම් රජවරු තමන් **'පෙර සිරිත'** නො ඉක්මවා ක්‍රියා කළ බව ශිලා ලිපිවල ලියා තැබූහ.

මානවම්ම පෙළපතේ පාලන අවදිය වන විට රට තුළ හොඳ මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් පැවැති බවට සාක්ෂි තිබේ. හතරවන මිහිඳු රජුගේ (ක්‍රි. ව. 956 - 972) මිහින්තලේ **පුවරු ලිපිය** එකල පැවති මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඉතා වැදගත් ලේඛනයකි. මිහින්තලේ විහාරයෙහි අභ්‍යන්තර පාලනය හා භික්ෂූන් වහන්සේලා පිළිපැදිය යුතු සිරිත් විරිත් ගැන එම ලිපියේ සඳහන් වේ. ලිපියේ දැක්වෙන ආකාරයට විහාරයට දිනපතා ලැබෙන ආදයම ලේඛනයක සටහන් කළ යුතු වේ. එසේ ම විහාරයේ කටයුතුවලට දිනපතා වැය වෙන මුදල **පඤ්චිකා පොතේ** (පාස්පොතෙහි) ලියා අදළ නිලධාරින්ගෙන් අත්සන් ලබාගෙන මුද්‍රිත පෙට්ටියෙහි තැබිය යුතු ය.



රූපය 2.3 හතරවන මිහිඳු රජුගේ මිහින්තලේ පුවරු ලිපිය

මාසය අවසානයේ දී මාසයේ වියදම වෙන ම අත්පොතකට ගෙන දෛනික ලේඛන ඉවත් කළ යුතු වේ. මාස දෙළහ අවසානයේ දී ඒ ඒ වියදම ලේකම් පොතේ ලියා භික්ෂූන් වහන්සේලා ඉදිරියේ කියවා අනුමැතිය ලබා ගත යුතු ය.

මේ අනුව විහාරයේ අය වැය පිළිබඳ දෛනිකව හා මාසිකව වාර්තා තබා වර්ෂය අවසානයේ වාර්ෂික අය වැය ලේඛනයක් සැකසූ බව පෙනේ.

අනුරාධපුර යුගයේ රජවරු සමාජ ශුභ සාධනය ගැන ද විශේෂ උනන්දුවක් දැක්වූහ. ඒ පිළිබඳ උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- බුද්ධදාස රජතුමා සෑම ගම් දහයකට ම වෛද්‍යවරයෙකු බැගින් පත් කොට වෙදහල් කරවීම.
- පළමුවන උපතිස්ස රජු අන්ධයන් හා රෝගීන් සඳහා ආරෝග්‍ය ශාලා හා දන ශාලා පිහිටුවීම.
- පළමුවන උදය රජු පොළොන්නරුව හා පදවියේ ආරෝග්‍ය ශාලා පිහිටුවා ඒවායේ නඩත්තුවට ගම් බිම් පිදීම.
- පස්වන කස්සප රජු වසංගත රෝගීන්ට සාත්තුව පිණිස අනුරාධපුරයේ ආරෝග්‍යශාලා තනවා නගරයේ වෙදහල් පිහිටුවීම.

## ශාසනික අභිවෘද්ධිය

බුදු දහම මෙරටට ලැබීමෙන් පසු සෑම රජ කෙනෙකු ම පාහේ බුද්ධ ශාසනයේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම මෙරට ඉතිහාසයේ කැපී පෙනෙන ලක්ෂණයකි. භික්ෂූන් වහන්සේලා රාජ්‍ය අනුශාසකයන් ලෙස කටයුතු කළ බැවින් රජු හා ශාසනය අතර හොඳ සබඳතාවක් පැවතුණි. මේ නිසා විහාරාරාම තැනවීම, ඒවායේ නඩත්තුවට අවශ්‍ය ගම් බිම් ප්‍රදානය, භික්ෂු අධ්‍යාපන කටයුතු සඳහා පිරිවෙන් පිහිටුවීම ඇතුළු ශාසනයේ උන්නතිය වෙනුවෙන් ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක් ම ගැනීමට රජවරු කටයුතු කළහ.


## * කලාපීය දේශපාලන ප්‍රවණතා හා විදේශ ප්‍රතිපත්තිය

අනුරාධපුර යුගය අග භාගය වන විට දකුණු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය මෙරට දේශපාලන කටයුතු කෙරෙහි බලපාන සාධකයක් බවට පත් විය. මේ නිසා දකුණු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය ගැන මෙහි දී කෙටියෙන් විමසා බැලීම වැදගත් වේ.

මේ කාලයේ දී ලංකාව කෙරෙහි සෘජු බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජධානි තුනක් තිබුණි.

### ⏭ පාණ්ඩ්‍ය රාජ්‍ය

දකුණු ඉන්දියාවේ නැගෙනහිර වෙරළ ආසන්නයේ ලංකාවට ඉතා සමීපව පාණ්ඩ්‍ය රාජ්‍ය පිහිටා තිබුණි. ක්‍රි.ව 6 වන සියවස අවසාන කාලයේ සිට පාණ්ඩ්‍ය රාජ්‍ය බලවත් වූ අතර ලංකාවට ද එහි බලපෑම් එල්ල විය. **මදුරාපුරය** පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර විය.




සිතියම 2.1 ශ්‍රී ලංකාවට ආසන්න දකුණු ඉන්දියානු රාජ්‍ය

### ⏭ චෝල රාජ්‍යය

පාණ්ඩ්‍ය රාජ්‍යයට උතුරෙන් දකුණු ඉන්දියානු නැගෙනහිර වෙරළට ආසන්නව මෙම රාජ්‍ය පිහිටා තිබුණි. වර්තමාන **තන්ජෝරය** අගනුවර කරගත් චෝලයෝ ඇතැම් අවස්ථාවල පාණ්ඩ්‍ය රාජ්‍යයට ද එරෙහිව ආක්‍රමණ දියත් කළහ. ක්‍රි. ව. 9 වන සියවස හා 10 සියවසේ දී චෝලයෝ ප්‍රබල රාජ්‍යයක් පිහිටුවා අධිරාජ්‍ය බලයක් ගොඩනැගුහ. අනුරාධපුර රාජධානිය බිඳ වැටුණේ ද රාජ රාජ හා රාජේන්ද්‍ර නම් චෝල රජවරුන් එල්ල කළ ආක්‍රමණවලිනි.

### ⏭ පල්ලව රාජ්‍යය

දකුණු ඉන්දියාවේ චෝල රාජ්‍ය පැවති භූමියට උතුරෙන් පල්ලව රාජධානිය පිහිටා තිබුණි. **කාංචිපුරය**, පල්ලව රාජ්‍යයේ අගනුවර විය. දකුණු ඉන්දියාවේ මුල්වරට විශාල අධිරාජ්‍ය බලයක් ගොඩනැගුවේ ද පල්ලවයන් ය. ක්‍රි. ව. 7 සියවස වන විට පල්ලවයන් ශක්තිමත් බලයක් ගොඩනගා



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

තිබූ අතර 9 වන සියවස පමණ දක්වා පල්ලව බලය පැවතුණි.

දකුණු ඉන්දියාවේ පැවති මෙම දේශපාලන තත්ත්වයට මුහුණ දීමේ දී ලංකාවේ රජවරු පාණ්ඩ්‍යයන්ට එරෙහිව පල්ලවයන් සමග ද චෝල බලයට එරෙහිව පාණ්ඩ්‍යයන් සමග ද එකමුතුව කටයුතු කළහ. රාෂ්ට්‍රකූට වැනි තවත් භාරතීය රාජ්‍ය පැන නැගුණු විට එම රාජ්‍ය සමග සමගියෙන් කටයුතු කිරීමෙන් මෙරට රජවරු ආක්‍රමණ වලක්වා ගැනීමට උත්සාහ කළහ. ලංකාවේ රජවරුන් කෙතරම් උපායශීලීව කටයුතු කළත් ඉන්දියාවේ එක් එක් රාජධානි අතර පැවති තරගයත් බලය ව්‍යාප්ත කර ගැනීමේ උත්සාහයත් නිසා අනුරාධපුර යුගයේ අග භාගයේ දී දකුණු ඉන්දියානු ආක්‍රමණ කිහිපයක් මෙරටට එල්ල විය.

මානවම්ම රජ පෙළපත යටතේ අනුරාධපුර රාජධානිය සෞභාග්‍යමත්ව පැවතියත් පස්වන මිහිඳු රජුගේ කාලය (ක්‍රි. ව. 982 -1017) වන විට මධ්‍ය පාලනය දුර්වල වී අභ්‍යන්තර ගැටුම් උත්සන්නව පැවතුණි. වරින් වර ගෙන්වූ දකුණු ඉන්දියානු හමුදාවන් ඒ වන විට අනුරාධපුර නගරය තුළ සිට ඇත. රටේ ආර්ථිකය දුර්වල වී තිබුණු බැවින් එකී හමුදාවට වැටුප් ගෙවීමටත් රජුට හැකියාවක් නො තිබුණි. මේ නිසා දකුණු ඉන්දියානු හමුදාව රජ වාසල වටලා තිබේ. පස්වන මිහිඳු රජු ආරක්ෂාව පතා රුහුණු රටට පලා ගියේ ය. ලංකාවේ පැවති මේ දුර්වල දේශපාලන වාතාවරණය ඉන්දියාවට ආරංචි වී රාජ රාජ නම් චෝල අධිරාජයා මෙරට ආක්‍රමණය කළේ ය. දිවයිනට පැමිණි චෝලයෝ අනුරාධපුරය, පොළොන්නරුව ඇතුළු රජරට ප්‍රදේශ රැසක් අල්ලා ගත්හ. අනතුරුව පොළොන්නරුව තම අගනුවර කර ගත් ඔවුහු චෝල අධිරාජ්‍යයේ කොටසක් වශයෙන් රජරට ප්‍රදේශ පාලනය කළහ.

මෙපරිද්දෙන් ශත වර්ෂ 14ක පමණ කාලයක් සමෘද්ධිමත් වූ ද අභිමානවත් වූ ද ශිෂ්ටාචාරයකට පදනම සැපයූ අනුරාධපුර රාජධානිය වර්ෂ 1017 දී බිඳ වැටුණි. මෙසේ වසර 70කට අධික කාලයක් චෝල පාලනය යටතේ පැවති රජරට විශාල ප්‍රදේශයක් එම පාලනයෙන් මුදවාගෙන ලාංකිකයන්ගේ අභිමානය නැවත ගොඩ නගන ලද්දේ පළමුවන විජයබාහු රජතුමා විසිනි.

**ක්‍රියාකාරකම**

**මානවම්ම රජ පෙළපත ඇසුරෙන් කෙටි ප්‍රශ්න පොතක් සකස් කරන්න.**

## මහා විජයබාහු රජතුමා (1055 -1110)

පළමුවන විජයබාහු රජතුමා හෙවත් මහා විජයබාහු රජතුමා ලංකා ඉතිහාසයේ එන ශ්‍රේෂ්ඨ පාලකයෙකි. විජයබාහු රජතුමා රජ වීමට පෙර කුඩා අවධියේ දී කිත්ති යන නමින් හැඳින්විණි. කුමරුගේ පියා මහාසාමි මොග්ගල්ලාන ය. මව ලෝකිතා දේවිය යි. මේ රජතුමා ගැන හැදෑරීමේ දී වැදගත්වන මූලාශ්‍රය කිහිපයක් පහත දැක්වේ.

- ✯ මහාවංසය
- ✯ පනාකඩුව තඹ සන්නස
- ✯ අඹගමුව ශිලාලිපිය

ක්‍රි. ව. 1017 දී දකුණු ඉන්දියාවේ චෝල අධිරාජ්‍යයේ පාලකයා වූ පළමුවන රාජේන්ද්‍ර රජු ලංකාව ආක්‍රමණය කර පස්වන මිහිඳු රජතුමා සිරකරුවෙකු ලෙස චෝළ දේශයට රැගෙන ගියේ ය. එතැන් සිට ක්‍රි. ව. 1070 දක්වා රජරට පාලනය කරන ලද්දේ චෝළ පාලකයන් විසිනි. මේ අවධියේ දී චෝලයින් මෙරට රාජ්‍යයට උරුමකම් කී කුමාරවරුන් සොයමින් මරණයට පත් කිරීමට උත්සාහ දරා ඇත. පස්වන මිහිඳු රජුගේ පුත් කස්සප (වික්‍රමබාහු) සොයා මරා දැමීමට කීප වරක්ම චෝලයන් දැරූ උත්සාහය අසාර්ථක විය.

පස්වන මිහිඳු රජතුමා ක්‍රි. ව. 1029 දී චෝල දේශයේ දී මිය ගියේ ය. එයින් පසුව ලාංකිකයෝ රුහුණු රට මුල් කරගෙන චෝල විරෝධි ව්‍යාපාරයක් ආරම්භ කළහ.

මේ කාලයේ දී තමන්ට විරුද්ධව රුහුණේ දේශපාලන බලයක් ගොඩනැගීම වැළැක්වීමට චෝලයන් උපායශීලීව කටයුතු කර තිබේ. එහි දී චෝලයන් අනුගමනය කළ උපායන් කිහිපයක් පහත දැක්වේ.

- වරින් වර පොළොන්නරුවේ සිට රුහුණට කඩා වැදී සම්පත් විනාශ කිරීම
- රාජ්‍ය උරුමකරුවන් ඝාතනය කිරීම


මෙමගින් රෝහණය දේශපාලන වශයෙන් අස්ථාවර කිරීමට චෝලයන් උත්සාහ ගත් බව පෙනේ. විජයබාහු රජු රුහුණේ බලය ලබා ගැනීමට පෙර එම ප්‍රදේශයේ පාලකයන් අතර ද එක්සත්කමක් නොතිබුණි. එම තත්ත්වයෙන් ද චෝලයෝ වාසි ලබා ගත්හ.

## විජයබාහු රුහුණේ පාලකයා වීම

විජයබාහු රජුට ඔහුගේ ළමා කාලයේ සිට ම උපකාර කළ ප්‍රභූවරයෙක් සිටියේ ය. රුහුණේ සිත්නරු බිම් බුදල්නා හෙවත් බුද්ධරාජ යනු එකී ප්‍රභූවරයා වේ. බුද්ධරාජ කිත්ති කුමරු ඇතුළු රජ පවුලට ආරක්ෂාව සපයමින් සතුරන්ට එරෙහිව සටන් මෙහෙයවමින් කුමරුට රුහුණේ බලය ලබා ගැනීමට බොහෝ උපකාර කළේ ය. බුද්ධරාජ සෙන්පතිගේ සේවය ගැන පනාකඩුව තඹ සන්නසේ තොරතුරු සඳහන් ය. විජයබාහු රජුගේ චරිතය දෙස බලන විට ළමා කාලයේ සිට ම සතුරන්ගෙන් රට නිදහස් කර ගැනීමේ දැඩි අධිෂ්ඨානයෙන් කටයුතු කළ බව පෙනේ.

මෙම අරමුණ ඉටු කර ගැනීමට ක්‍රියා කිරීමේ දී මුලින් ම රුහුණේ රජකම ලබා ගැනීම සඳහා සටන් කිරීමට කිත්ති කුමරුට සිදු විය. එවකට රුහුණේ පාලකයා වූ කේශධාතු කාශ්‍යප සමග ඇති වූ ගැටුමේ දී

**පනාකඩුව තඹ සන්නස**



මේ සන්නස දකුණු පළාතේ මොරවක්කෝරලයේ පනාකඩුව නම් ගමේ කුඹුරක තිබී හමු විය. මෙහි රජතුමාගේ ළමා කාලයේ සිට ම තොරතුරු සඳහන්ව ඇත. ළමා කාලයේ දී මෙතුමාට අපමණ දුක් ගැහැට විඳීමට සිදු වූ බව මෙම සන්නසේ සඳහන් වෙයි. ආහාර පාන පවා නොමැතිව බොහෝ දුක් ගැහැට මැද වාසය කර තිබේ. එහි දී කුමරු ඇතුළු දෙමාපියන්ට රැකවරණය සලස්වා ඇත්තේ බුද්ධරාජ හෙවත් සිත්නරු බිම්හි බුදල්නා නම් සෙන්පතියෙකි. මොහු එකල රුහුණේ සිටි ජන ප්‍රධානියෙකි. බුදල්නා වෙත ලබා දුන් වරප්‍රසාද රැසක් ගැන මේ සන්නසේ සඳහන් වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 2.4 විජයබාහු රජු අනුරාධපුරයේ ඉදි කළ මාලිගාවේ නටබුන්

බුද්ධරාජ ඇතුළු පිරිස කුමරුට බොහෝ උපකාර කර තිබේ. මේ සටන්වලින් කේශධාතු කාශ්‍යප පරාජය වූ බැවින් කිත්ති කුමරු 1055 දී කතරගම පාලන මධ්‍යස්ථානය කර ගනිමින් පළමුවන විජයබාහු නමින් රජ විය.

## ලංකාව චෝල බලයෙන් නිදහස් කර ගැනීම

පළමුවන විජයබාහු රුහුණේ බලයට පත් වී වැඩි කාලයක් යාමට පෙර චෝලයෝ රුහුණ ආක්‍රමණය කළෝ ය. රජු බලය ස්ථාවර කර ගැනීමට පෙර රජුගේ හමුදාව විනාශ කර දැමීම චෝලයන්ගේ අරමුණ විය. එහෙත් රජු මේ බව දැනගෙන මලය ප්‍රදේශයට (කඳුකර ප්‍රදේශයට) පලාගිය බැවින් චෝලයන්ගේ අරමුණු ඉටු නො වීය. චෝලයෝ රුහුණ කොල්ල කා පොළොන්නරුවට ගියහ. නැවත රෝහණයට ගොස් ස්වකීය දේශපාලන බලය ගොඩනගමින් සිටි විජයබාහු රජතුමා අනාගත සටනට අවශ්‍ය විදේශ ආධාර ලබා ගැනීමට බුරුමය සමග මිත්‍ර සබඳතා ගොඩනගා ගත්තේ ය. විජයබාහු රජු යටතේ රුහුණේ දේශප්‍රේමී සටනක් පිළියෙල වන බව ආරංචි වූ රජරට වැසියන් චෝලයන්ට බදු ගෙවීම නවතා ඔවුන්ට එරෙහිව කැරලි ගැසූ බව වාර්තා වේ.

ලංකාවේ තම පාලනයට එරෙහි ව ලාංකිකයන් සංවිධානය වන බව ඇසූ චෝල අධිරාජයා පොළොන්නරුවේ සිටි චෝල පාලකයාට ආධාර පිණිස හමුදා කණ්ඩායමක් එවී ය. මෙසේ ශක්තිමත් වූ චෝලයන් නැවත වරක් රුහුණ ආක්‍රමණය කර ඇත. විජයබාහු රජු සමග ඇති වූ පළමු සටනින් චෝලයෝ පරාජය වූහ. අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් විජයබාහු රජු සිය හමුදාව සමග ගොස් පොළොන්නරුව අල්ලා ගත්තේ ය. මේ අවස්ථාවේ දී ඉන්දියාවේ චෝල අධිරාජයා පොළොන්නරුවේ චෝල පාලකයාට ආධාර පිණිස නැවතත් හමුදාවක් එවී ය. එහි දී විජයබාහු රජු සහ චෝලයන් අතර නැවත රජරට දී සටන් ඇති විය. එහි දී පරාජය වූ විජයබාහු රජු රැකවරණ පතා කෑගලු දිස්ත්‍රික්කයේ **වාකිරිගලට** පසු බැස්සේ ය.

මෙසේ පසුබැස පසුව ක්‍රමයෙන් තම හමුදාව ගොඩනගා ගත් රජු අනතුරුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහානාගකුල ප්‍රදේශයට ගොස් අවසන් සටනට සූදානම් විය. වර්ෂ 1070 දී විජයබාහු රජු සියලු ශක්තිය යොදා පොළොන්නරුව ආක්‍රමණය කළ අතර ඉන්දියාවෙන් චෝල හමුදා පැමිණියහොත් ඔවුන්ට පහර දීමට මහාතිත්ථයට හමුදා කණ්ඩායමක් ද යැවීය. රජරට දී ඇති වූ



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

සටන්වලින් විජයබාහු රජුට ජය ලැබුණි. මෙසේ වර්ෂ 1070 දී විජයබාහු රජතුමා පොළොන්නරුව අල්ලා ගැනීමත් සමග වසර 70ක් පමණ පැවති චෝල පාලනය බිඳ වැටුණි. ඉන්දියාවේ ප්‍රබල චෝල අධිරාජ්‍ය සමග සටන් කොට ලංකාව චෝල බලයෙන් නිදහස් කර ගැනීම විජයබාහු රජුගෙන් සිදු වූ ඉතා වැදගත් සේවයකි.

## විජයබාහු රජුගේ පාලන කාලය

විජයබාහු රජතුමා වර්ෂ 1070 සිට වසර 40 ක් පමණ ලංකාව පාලනය කළේ ය. මේ කාලයේ දී පොළොන්නරු අගනුවර කොට ගනිමින් නැවත වරක් එක්සත් හා සාමකාමී ලංකාවක් බිහිවිය. මේ නිසා පොළොන්නරු යුගයේ මුල් ම රජතුමා පළමුවන විජයබාහු රජතුමා වේ. ඊට අමතරව එතුමාගෙන් සිදු වූ ඉමහත් සේවාවන් කිහිපයක් පහත දැක්වේ.

- ඇපා, මාපා තනතුරු ඇති කොට සාම්ප්‍රදායික පරිපාලන රටාව නැවත පිහිටුවීම.
- වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කොට ආර්ථික සමෘද්ධිය ඇති කිරීම.
- අනුරාධපුරයේ රාජ මාලිගාවක් තැනවීම (රූපය 2.4)

## විජයබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය

අනාගතයේ චෝල ආක්‍රමණයක් වලක්වා ගැනීම හා අවට රටවල් සමග වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීම රජුගේ විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන මූලික ලක්ෂණයක් වේ. අනාගතයේ චෝල ආක්‍රමණයන් වැළැක්වීමට එතුමා ඉන්දියාවේ චෝලයන්ට විරුද්ධ වෙනත් රාජ්‍ය සමග සබඳතා ඇති කර ගත්තේ ය. රජුගේ සහෝදරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමරෙකුට සරණපාවා දී පාණ්ඩ්‍ය රාජ්‍ය සමග මිතුරු සබඳතා තහවුරු කර ගත්තේ ය. එතුමා තිලෝකසුන්දරී නම් කාලිංග වංශික කුමරියක විවාහ කරගෙන කාලිංග දේශය සමග මිතුරු විය.

දූත හුවමාරුවෙන් හා තෑගි භෝග යවමින් බටහිර චාලුක්‍ය රාජවංශය සමග ද මිතුරු විය. මීට අමතර ව ලංකාවේ ආර්ථික සහ ශාසනික උන්නතියට කටයුතු කිරීමට බුරුමය සමග විදේශ සබඳතා ගොඩනගා ගැනීමට රජු කටයුතු කර ඇත.

විජයබාහු රජුගේ ආගමික කටයුතු,

- බුරුම රටින් භික්ෂූන් වැඩමවා උපසම්පදාව යළි පිහිටුවීම.
- පොළොන්නරුවේ තෙමහල් දළඳා මන්දිරයක් ගොඩනැගීම.
- ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය ප්‍රතිසංස්කරණය කරවා එම ස්ථානයට ගම් බිම් පිදීම.
- අනුරාධපුරයේ සහ රුහුණේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

## විජයබාහු රජුගෙන් ගත හැකි ආදර්ශ

විජයබාහු රජතුමා යනු ළමා කාලයේ සිට අභියෝග රැසක් ජය ගනිමින් රටට විශාල සේවයක් කළ ආදර්ශවත් රජ කෙනෙකි. කුඩා කාලයේ දී පා තැබූ තැබූ තැන තමා සොයා එන සතුරන්ගෙන් මිදී වනගතව කටුක ආහාර වලින් යැපෙමින් මේ රජු ළමා කාලය ගෙවූ ආකාරය පනාකඩුව තඹ සන්නසෙහි කියා තිබේ. රජකමට පත් වීමෙන් පසුව ද කුඩා කාලයේ තමා දුක් විඳි ආකාරය ස්වකීය වචනයෙන් ම කියා තිබීම එතුමාගේ අවංකකම කියාපාන්නකි. කුඩා කාලයේ තමාට උදව් කළ බුද්ධරාජට රජ වූ පසු වරප්‍රසාද ලබා දීමෙන් කෘත ගුණ සැලකීමේ ගුණය එතුමා තුළ තිබූ බව පැහැදිලි වේ. චෝලයන් සමග සටන් කිරීමේ දී යම් යම් අවස්ථාවල පරාජය ලැබීමට මෙතුමාට සිදු විය. එහෙත් ඒ පරාජයන් හමුවේ නොසැළුණු රජු නැවතත් ස්වකීය

දුර්වලතා හඳුනාගෙන සටනට සැරසුණි. රජු තුළ පැවති නොපසුබස්නා උත්සාහය නමැති ගුණය වර්තමාන සමාජයට වුව ද හොඳ ආදර්ශයකි. රජුගේ චරිතය දෙස බලන විට මව්බිම රැක ගැනීම ගැන එතුමා තුළ ලොකු හැඟීමක් තිබුණු බව පෙනේ. බලයට පත් වීමෙන් පසුව ද විදේශ ආක්‍රමණ වලක්වා ගැනීම කෙරෙහි එතුමා විශේෂ අවධානයක් යොමු කළේ ය. එතුමාගේ උසස් ගුණාංග අඹගමුව සෙල්ලිපියේ ඉතා විචිත්‍ර පරිදි දක්වා තිබේ.

විජයබාහු රජුගේ උසස් ගුණාංග පිළිබඳ අඹගමු සෙල්ලිපියේ සඳහන් පාඨවල සරල අර්ථය මෙසේය.

| | | |
|---|---|---|
| තුණුරුවනට | - | පුද සත්කාර |
| ගුරුවරුන්ට | - | උවටැන් |
| ධාර්මික ජනයාට | - | ගෞරවය |
| උගතුන්ට | - | සෞභාග්‍ය |
| ඥාතීන්ට | - | අනුග්‍රහය |
| මිතුරන්ට | - | මිත්‍රත්වය |
| සතුරන්ට | - | පරාජය |
| සියලු සතුන්ට | - | කුළුණු ගුණය |
| සභාවට | - | නුවණ |
| තමනට | - | සම්පූර්ණත්වය |

## ක්‍රියාකාරකම

විජයබාහු රජු පිළිබඳ පාඩම ඇසුරෙන් පහත සඳහන් ද්විත්ව සටහන් ජර්නලය සම්පූර්ණ කරන්න.

| මුහුණ දුන් අභියෝග | එම අභියෝග ජය ගත් ආකාරය (සිසු ප්‍රතිචාර) |
|---|---|
| 1. ළමා කාලය | |
| 2.රුහුණේ බලය ලබා ගැනීම | |
| 3. පොළොන්නරු නගරය නව අගනගරයක් ලෙස ගොඩනැගීම | |

මහා පරාක්‍රමබාහු රජතුමා යනු බෙදී තිබුණ ලංකාව එක්සේසත් කරමින් රටේ දියුණුවට සුවිශාල මෙහෙවරක් ඉටු කිරීමට සමත් වූ රජ කෙනෙකි.

පළමුවන විජයබාහු රජතුමා ගොඩනැගූ දේශපාලන එක්සත්කම රජුගේ මරණින් පසුව බිඳ වැටුණි. විජයබාහු රජුගේ අභාවයෙන් පසුව මෙරට සිටි කාලිංග වංශයට හිතවත් පිරිස හා පාණ්ඩ්‍ය වංශිකයන්ට හිතවත් අය අතර රාජ්‍ය උරුමය පිළිබඳ ගැටුමක් ඇති විය. එම ගැටුම නිසා එක් නායකයෙකුට වත් ස්ථාවර බලයක් ගොඩනගා ගත නොහැකි විය. එහි ප්‍රතිඵල වශයෙන් රජරට, දක්ඛිණ දේශය හා රුහුණ වශයෙන් රට කොටස් තුනකට බෙදී පාලන මධ්‍යස්ථාන තුනක් බිහි විය. පරාක්‍රමබාහු කුමාරයාගේ උපත සිදු වූයේ රටේ මෙබඳු ව්‍යාකූල පසුබිමක් තිබිය දී ය.

පරාක්‍රමබාහුගේ පියා ඉහත කී මිත්තා කුමරියගේ පුතෙකු වූ මානාභරණ වේ. හෙතෙම පළමුවන මානාභරණ ලෙස සැලකිය හැකි ය. පරාක්‍රමබාහු කුමාරයාගේ මව රත්නාවලී කුමරිය යි. පළමුවන මානාභරණ දක්ෂිණ දේශයේ පාලකයා වශයෙන් දැදිගම ප්‍රදේශයේ සිටිය දී පරාක්‍රමබාහු කුමාරයාගේ උත්පත්තිය සිදු වී තිබේ. දැදිගම කොටවෙහෙර හෙවත් සූතිඝර චෛත්‍ය ඉදි කර ඇත්තේ එදා පරාක්‍රමබාහු කුමරා උපන් ස්ථානයේ ය.

පරාක්‍රමබාහු කුමරුගේ ළමා කාලයේ දී පියා මිය ගියේ ය. මේ නිසා සිය මව සමග



රූපය 2.5 දැදිගම කොටවෙහෙර

කිත්සිරිමේඝ නම් සුළු පියා වෙත ගිය කුමරා එහි ඇති දැඩි විය. පරාක්‍රමබාහු කුමරුන් අනාගත රාජ්‍ය උරුමකරුවෙකු බැවින් ඔහුට අධ්‍යාපනය ලබාදීම සඳහා සුළු පියා උනන්දු විය. කුමරු ද බොහෝ ආශාවෙන් භාෂාව, දුනු ශිල්පය ඇතුළු හැසිරවීම වැනි විෂයන් හදාරා ඇත.

පරාක්‍රමබාහු කුමාරයාගේ සුළු පියා වූ කිත්සිරිමේඝ දක්ඛිණ දේශයේ පාලකයා විය. කිත්සිරි මේඝගේ අභාවයෙන් පසුව පරාක්‍රමබාහු කුමරාට එම ප්‍රදේශයේ බලය ලැබුණි. එතුමා විසින් දක්ඛිණ දේශයෙහි පරාක්‍රම පුරය යනුවෙන් අලුත් නගරයක් ඉදි කළේ ය. වර්තමානයේ **පඬුවස් නුවර** ලෙස හඳුන්වන එම ප්‍රදේශයේ එකල ඉදි කළ ගොඩනැගිලි, නටබුන් ආදිය දක්නට ලැබේ. බොහෝ අධිෂ්ඨානශීලී තැනැත්තෙක් වූ පරාක්‍රමබාහු කුමරා දක්ඛිණ දේශයේ පාලකයාව සිටිය දී එම ප්‍රදේශය ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කිරීමේ ව්‍යාපාරයක් ගෙන ගියේ ය. අහසින් වැටෙන එක දිය බිඳක් වත් මහජනයාගේ ප්‍රයෝජනයට නොගෙන නිකරුණේ මුහුදට ගලා යාමට ඉඩ දීම නුසුදුසුය යන ආදර්ශ පාඨයට අනුව පරාක්‍රමබාහු රජු එහි දී කටයුතු කොට ඇත. පරාක්‍රමබාහු දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධියේ පොළොන්නරුවේ සිටි වික්‍රමබාහු රජුගේ මරණින් පසු ඔහුගේ පුත් දෙවන ගජබාහු එහි බලයට පත් විය. එසේ ම රුහුණේ සිටි සිරිමල්ලහගේ මරණින් පසු ඔහුගේ පුත් දෙවන මානාභරණ රුහුණේ බලයට පත් විය. අනතුරුව පොළොන්නරුවේ බලය ලබා ගැනීමට පරාක්‍රමබාහු, දෙවන ගජබාහු හා දෙවන මානාභරණ අතර සටන් රැසක් ඇති විය. එහි දී පරාක්‍රමබාහු කුමරා හා දෙවන ගජබාහු රජු අතර දෙවන මානාභරණට එරෙහිව ගිවිසුමක් ඇති කරගෙන තිබේ. එම ගිවිසුම අනුව එක් අයෙකුගෙන් පසුව අනෙක් අයට රාජ්‍ය හිමි වේ.

මේ ගිවිසුමේ පිටපතක් ශිලා ලේඛනයක් ලෙස ලියවා තිබී කුරුණෑගල දිස්ත්‍රික්කයේ සංගමු විහාර භූමියෙන් හමු විය. එය **සංගමු විහාර ලිපිය** ලෙස හැඳින්වේ.

පරාක්‍රමබාහු රජු හා ගජබාහු රජු අතර ගිවිසුමෙන් පසුව ද මානාභරණ සිය සටන අත්හැර නැත. ගජබාහු රජුගේ මරණින් පසුව දෙවන මානාභරණ පරාක්‍රමබාහු සමග සටනට පැමිණුණි. එහි දී ඇති වූ සටන්වලින් දෙවන මානාභරණ පරාජය වී රුහුණට පලා ගියේ ය.



**රූපය 2.6 පරාක්‍රමබාහු රජමාළිගය**



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



රූපය 2.7 පළමුවන පරාක්‍රමබාහු රජුගේ රාජසභාව

මේ අනුව පොළොන්නරුවේ බලය පිහිටුවා ගැනීමට පරාක්‍රමබාහු රජුට හැකි විය. නොබෝ කලකින් දෙවන මානාභරණ රුහුණේ දී මිය ගිය නමුත් ඔහුගේ මව වූ **සුගලා බිසව** එම හමුදාවට නායකත්වය දෙමින් පරාක්‍රමබාහු රජුට එරෙහි සටන ඉදිරියට මෙහෙය විය. මේ අවධිය වන විට මෙරට රාජ්‍ය උරුමයේ සංකේතය වශයෙන් සැලකුණු දළදාව සහ පාත්‍ර ධාතුව ද සුගලා බිසව වෙත තිබුණි. එම පූජනීය වස්තු තමා භාරයේ තබා ගනිමින් සුගලා බිසව අඛණ්ඩව සටන් කළ නමුත් ඉතා සංවිධානාත්මක සටනක් ගෙන යමින් සුගලාව පරාජය කිරීමට පරාක්‍රමබාහු රජු සමත් විය.

සුගලා බිසව පරාජය කිරීමෙන් පසු දළදාව සහ පාත්‍ර ධාතුව තමා භාරයට ගැනීමට පරාක්‍රමබාහු රජුට හැකියාව ලැබුණි. මේ අනුව 1153 දී නැවත වරක් පළමුවන පරාක්‍රමබාහු රජු යටතේ එක්සත් හා සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි විය.

## ආර්ථික සංවර්ධන කටයුතු

පරාක්‍රමබාහු රජුගේ ආර්ථික කටයුතු ආරම්භ වූයේ එතුමා දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධියේ දී ය. දැදුරු ඔයේ ජලය කෘෂි කටයුතුවලට යොදා ගැනීම සඳහා අමුණු බැඳ ජලය හරවා තිබේ. එබඳු ස්ථාන තුනක් වංශ කථාවේ සඳහන් වේ. **කොට්ඨ බද්ධ, සූකර නිජ්ඣර, දෝරදක්ඛිත** යනු එම ස්ථාන වේ. එසේ ම කුඩා වැව් විශාල කිරීම මෙන් ම තවත් වැව් අමුණු රැසක් ප්‍රතිසංස්කරණය කිරීම ද එකල සිදු වී ඇත.

පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී කළු ගඟ හා බෙන්තර ගඟ අතර පිහිටි පස්දුන් කෝරලයේ වගුරු බිම්වල ජලය බස්සවා එම බිම් සංවර්ධනය කරවා තිබේ. රජු පොළොන්නරුවේ බලයට පත් වීමෙන් පසු කෘෂිකාර්මික සංවර්ධනයට ඉමහත් සේවයක් සිදු කර ඇත. මේ රජුගේ වාරි කර්මාන්ත අතර පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය විශිෂ්ට ම නිර්මාණයක් වේ. තෝපා වැව




නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හා දුඹුටුලු වැව යන වැව් දෙක ඒකාබද්ධ කිරීමෙන් මේ වැව නිර්මාණය කර තිබේ. මෙතුමාගේ කාලයේ දී වාරිමාර්ග 3910 ක් ද මහ වැව් 163ක් ද කරවන ලදැයි මහාවංසයේ සඳහන් වේ. ඊට අමතර ව අමුණු හා කුඩා වැව් ද තනවා තිබේ.

## ශාසනික කටයුතු

බුදු සසුනේ අභිවෘද්ධිය උදෙසා ද මහා පරාක්‍රමබාහු රජතුමා විශාල සේවයක් සිදු කළේ ය.

එතුමා තුන් නිකාය සමගි කොට සංඝ ශාසනයේ සමගිය ඇති කළේ ය. එසේ ම පොළොන්නරු කතිකාවත පිහිටු වීමට ද රජු පුරෝගාමී වූයේ ය. මෙම කතිකාවත පොළොන්නරුවේ උත්තරාරාමය හෙවත් ගල් විහාරයේ ශිලාලිපියක ලියා තිබේ. පොත්ගුල් විහාරය, පොළොන්නරුවේ කිරිවෙහෙර, පබළු වෙහෙර එතුමා කරවූ විහාරස්ථාන කිහිපයකි. එසේ ම අනුරාධපුරයේ වෙහෙර විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කරවූයේ ය.



රූපය 2.8 පොළොන්නරු ගල් විහාරයේ හිටි පිළිමය

## පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය

පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ කටයුතු විමසන විට බුරුමය හා දකුණු ඉන්දියාව සමග එතුමා කටයුතු කළ ආකාරය ඉතා වැදගත් වේ. ලංකාව, බුරුමය (රාමඤ්ඤ දේශය) අතර වෙළෙඳ හා ආගමික සම්බන්ධතා දිගු කලක සිට ම පැවතිණ. එහෙත් බුරුම පාලකයා වූ **අලවුංසිතු** රජු ලංකාවට විරුද්ධ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා එම සම්බන්ධතා මෙකල පලුදු වීමක් විය.

මේ නිසා ක්‍රි.ව. 1164 දී පමණ බුරුමය ආක්‍රමණය කිරීමට පරාක්‍රමබාහු රජතුමා කටයුතු කළේ ය. ඒ සඳහා **නගරගිරි කිත්ති** සෙනෙවි යටතේ නාවික හමුදවක් යැවී ය. මෙම ලාංකික හමුදවට ජයග්‍රහනය ලැබුණි. බුරුම ආක්‍රමණයෙන් ලංකාව ජයග්‍රහනය අත් කර දීම ගැන නගරගිරි කිත්ති සෙනෙවිට රජතුමාගෙන් ගම්බිම් ත්‍යාග ලැබුණි. මේ ගැන **දෙවනගල සෙල්ලිපියේ** සඳහන් වේ.

ඉන්දියාවේ පාණ්ඩ්‍ය රාජ්‍යයේ රජකම සම්බන්ධව ඇති වූ සටනක් සඳහා පරාක්‍රමබාහු රජු මැදිහත් වූයේ ය. මෙකල පාණ්ඩ්‍ය රාජ්‍යයේ පාලකයා වූ **පරාක්‍රම පාණ්ඩ්‍යට** විරුද්ධව කුලසේකර නම් කුමාරයෙක් සටන් කළේ ය. පරාක්‍රම පාණ්ඩ්‍ය රජු පරාක්‍රමබාහු රජතුමාගෙන් උදව් ඉල්ලීම නිසා **ලංකාපුර** හා **ජගත් විජය** නම් සෙනෙවියන් දෙදෙනා යටතේ සේනාවක් යැවීමට රජු පියවර ගත්තේ ය.

### ක්‍රියාකාරකම

පරාක්‍රමබාහු රජු පිළිබඳ පාඩම ඇසුරින් ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් පවත්වන්න.

## නිශ්ශංකමල්ල රජතුමා

පළමුවන පරාක්‍රමබාහු රජතුමාගෙන් අනතුරුව පොළොන්නරුවේ රජකම දැරූ පාලකයන් අතුරින් කැපී පෙනෙ පාලකයෙක් වූයේ නිශ්ශංකමල්ල රජතුමා ය. පරාක්‍රමබාහු රජතුමාට දරුවන් නොසිටි හෙයින් එතුමාගෙන් පසුව සිහසුනට පත් වූයේ දෙවන විජයබාහු නැමැත්තෙකි. දෙවන විජයබාහු රජතුමා පරාක්‍රමබාහු රජතුමාගේ සහෝදරියකගේ පුතෙක් යැයි මතයක් තිබේ. මේ රජුගේ අවධියේ උපරාජ පදවිය නිශ්ශංකමල්ල විසින් දරන ලදි. දෙවන විජයබාහු රජතුමාට සිහසුන දැරීමට හැකි වූයේ අවුරුද්දක කාලයක් පමණි. එතුමා ජීවිතක්ෂයට පත් කර මහින්ද නැමැත්තෙක් රජ විය. මහින්ද රජ වී පස්වන දිනයේ දී ඔහු නෙරපා දමා යුවරජ නිශ්ශංකමල්ල රජ විය. මේ අනුව නිශ්ශංකමල්ල රජකමට පත් වූයේ අවුල් සහගත දේශපාලන පසුබිමක් තුළ ය.

## නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභියෝග

1. විදේශයක ඉපදුණු අයෙකු හෙවත් කාලිංග වංශිකයෙකු වීම.

නිශ්ශංකමල්ල රජතුමා ඉන්දියාවේ කාලිංග දේශයේ සිටි ජයගෝප නැමැති රජෙකුගේ පුතා ය. මව පාර්වතී දේවිය යි. ඒ අනුව මේ රජතුමා කාලිංග වංශිකයෙකි. එතුමා නිතර ම මේ බව සඳහන් කර ඇත. එපමණක් නොව පොළොන්නරුව කාලිංග පුර ලෙස ද හඳුන්වා ඇත. මීට පෙර ලංකාවේ රජ කළ කාලිංග වංශිකයන් ලංකාවේ උපන් කුමාරවරු ය. එහෙත් නිශ්ශංකමල්ල රජු ඉන්දියාවේ කාලිංග දේශයේ ම උපන් අයෙකු වේ. එම විදේශීය ප්‍රභවය ඔහුට තිබුණ ප්‍රධාන අභියෝගයකි. ඊට අමතර ව තවත් ගැටලු රැසක් නිශ්ශංකමල්ල රජුට තිබුණි. එම ගැටලු කිහිපයක් පහත දැක්වේ.

2. පරාක්‍රමබාහු රජුගේ දක්ෂ සේනාපතියන් අවනතව තබා ගැනීම.

3. පාණ්ඩ්‍ය වංශිකයන් බලවත්වීම වලක්වා ගැනීම

4. රුහුණේ තම බලය පවත්වා ගැනීම.

ඉහත අභියෝග වලටමුහුණ දීමේ දී රජු රට පුරා සංචාරය කරමින් වැසියාගේ සිත දිනා ගැනීමට කටයුතු කළේ ය. දීර්ඝ ශිලා ලිපි පිහිටුවමින් වැසියන්ට අවවාද දී රජුගේ ශ්‍රේෂ්ඨත්වය හුවා දැක්වී ය. දඹුලු විහාරය හා ශ්‍රී පාදස්ථානය එතුමා සංචාරය කළ තැන්වලට උදහරණ වේ. රටවැසියා වෙනුවෙන් බොහෝ ආගමික හා ශුභසාධන කටයුතු සිදු කළේ ය. රජු හා රජ පවුලේ අය තරාදියේ එක් පසෙකට නගිමින් ද විවිධ වස්තුව තරාදියේ අනෙක් පසට එකී බරට සමාන ලෙස යොදමින් ද තුලාභාර දන දී ඇත. තුළාභාර දන යනු කිසියම් තැනැත්තෙකුගේ ශරීරයේ බරට සමාන ව යම් යම් වස්තුව දන් දීම වේ.

විවිධ අන්දමේ අභියෝග රැසකට නිශ්ශංකමල්ල රජුට මුහුණ පෑමට සිදු වූ නමුත් ඒ සියලු අභියෝග ජයග්‍රහණය කරමින් වසර නවයක් වැනි කාලයක් සිහසුන දැරීමට



රූපය 2.9 නිශ්ශංකමල්ල රජුගේ රාජසභාව



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

එතුමා සමත් විය. මෙම අවධිය තුළ රජුගේ ආධිපත්‍ය දිවයින පුරා ම පැවතිණි. ඒ බව ඔහුගේ සෙල්ලිපිවල එන විස්තර මගින් තහවුරු වේ.

නිශ්ශංකමල්ල රජතුමා ජනතා විශ්වාස දිනා ගනිමින් කටයුතු කර ඇත. රට පුරා ම සංචාරය කිරීම රටවැසියාගේ ශුභසාධක කටයුතු සිදු කිරීම තුළාභාර දන දීම වැනි කටයුතු මෙන් ම එතුමා සොර සතුරු බිය නැති කිරීමටත් දිළින්දන්ට සැලකීමටත් කටයුතු කළේ ය. මේ තොරතුරු රජු පිහිටවූ සෙල්ලිපිවල සඳහන් කර ඇත. පොළොන්නරුවේ ගල් පොත ශිලා ලිපිය, හැටදාගෙයි ශිලා ලිපිය, දඹුලු පර්වත ලිපිය, වාදුරුප්පෙ ලිපිය එවැනි ලිපි තුනකි.

රටවැසියාට ශුභ සිද්ධිය සැලැස්වීම සඳහා රජතුමා අනුගමනය කළ තවත් ප්‍රතිපත්තියක් වූයේ බදු සහන ලබා දීම යි. පෙර රජවරුන් අය කළ බදුවලින් ඇතැම් බදු වර්ග අවලංගු කිරීමටත් බදු සහන ලබා දීමටත් හෙතෙම කටයුතු කළේ ය.

පොළොන්නරුවේ දක්නට ලැබෙන ආගමික ගොඩනැගිලි කීපයක් ම මේ රජු විසින් ඉදි කරවන ලද ඒවා ය. දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා දළදා මැඳුරක් ඉදි කළේ ය. එය හැටදාගෙය ලෙස ප්‍රසිද්ධ ය. එසේ ම රන්කොත් වෙහෙර, වටදාගෙය, නිශ්ශංකලතා මණ්ඩපය මේ රජු කරවූ ගොඩනැගිලි ය.

පොළොන්නරුවේ නිශ්ශංකමල්ල රාජ සභා මණ්ඩපය නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල ද මේ රජු කරවූවක් ලෙස සැලකේ. එහි රාජ සභාව පවත්වා ඇත. එහි තිබෙන ගල් කණුවල රාජසභාවේ ඒ ඒ නිලධාරීන් අසුන් ගත යුතු ස්ථාන සඳහන් කර තිබීම විශේෂත්වයකි.



රූපය 2.10 නිශ්ශංක රාජ සභා මණ්ඩපයේ ගල් කණුවල නිලධාරීන්ගේ නම සඳහන් කරමින් ආසන පනවා තිබූ අයුරු

(රජු) සිංහාසනයේ වැඩහුන්කල සෙනෙවිරදුන්ට ස්ථානයයි. යනුවෙන් මෙම ගල් කණුවේ ලියා ඇත.

**ක්‍රියාකාරකම**

**නිශ්ශංකමල්ල රජතුමා පිළිබඳ රචනාවක් ලියන්න.**



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

සාරාංශය

- ලම්බකර්ණ හා මෞර්ය පෙළපත්වලට අයත් පාලකයන් අනුරාධපුර යුගයේ වැඩි කාලයක් පාලන බලය දැරීම. මෙම පෙළපත් දෙක අතර දේශපාලන බල අරගල පැවතීම.
- මානවම්ම රජ පෙළපත ද ලංකාවේ වැදගත් රජ පෙළපතක් වීම. වසර 50 කට පසු මෙම පෙළපතේ මානවම්ම රජු යටතේ දේශපාලන එක්සත් බවක් ඇති වීම.
- I සේන රජුගේ කාලයේ දී ලංකාවට පාණ්ඩ්‍ය ආක්‍රමණයක් එල්ල වීම.
- II සේන රජු පාණ්ඩ්‍ය රාජ්‍යය ආක්‍රමණය කිරීම.
- අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතු විධිමත්ව පැවතීම.
- දකුණු ඉන්දීය රාජධානි තුනක් ලංකාව කෙරෙහි බලපෑම් කිරීම.
- පොළොන්නරු යුගයේ මුල්ම රජු පළමු විජයබාහුය.
- පළමු පරාක්‍රමබාහු රජු යටතේ එක්සත් හා සමෘධිමත් ශ්‍රී ලංකාවක් බිහිවීම.
- නිශ්ශංකමල්ල රජු කාලිංග වංශයේ ආරම්භක පාලකයා වීම.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.